# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1434 /2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி |
| දිනය<br>Date | 16/11/2023<br>පැය 1345 | | |

## මාධ්‍ය නිවේදනය

**01. සැකකටයුතු මරණයක්- තලාතුඔය පොලිස් වසම.**

2023.11.15 වන දින දහවල් කාලයේදී තලාතුඔය පොලිස් වසමේ කඳාකුල ප්‍රදේශයේ පුද්ගලයෙකුගේ මෘත ශරීරයක් ඇති බවට තලාතුඔය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 27 ක් වූ තලාතුඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු 2023.11.12 වන දින සවස් කාලයේ නිවසින් පිටව ගොස් නැවත නිවසට නොපැමිණීම හේතුවෙන් 2023.11.13 වන දින මරණකරුගේ මව විසින් තලාතුඔය පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර 2023.11.15 වන දින ඉහත මරණකරුගේ මෘත ශරීරය තලාතුඔය මාරස්සන මාර්ගයේ ඇති බෝක්කුවක් අසල තිබී හමු වී ඇත.

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් අනතුරුව පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකිරීම සඳහා මහනුවර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තලාතුඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**02. මත් කරල් හා හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - ජයවර්ධනපුර පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.**

2023.11.15 වන දින උදෑසන කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ ආනන්දාරාම මාවත ප්‍රදේශයේදී ජයවර්ධනපුර පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මත් කරල් 374 ක්, හෙරොයින් මිලිග්‍රෑම් 600 ක් හා මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලද බවට සැක කරනු ලබන මුදල් රුපියල් 138,000/= ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 32 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**